මනතුංග- , ධම්මිකා කුමාරි
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Diversity*

# මෞර්යයන්ගේ දේශපාලන ඉතිහාසය ගොඩනැගීම
(ශ්‍රී ලාංකීය මූලාශ්‍රය ඇසුරින්)

මෞර්ය යුගය ඉන්දියානු ඉතිහාසයේ සුවිශේෂී කඩයිමක් සනිටුහන් කරයි. ක්‍රි.පූ. 4 වන සියවසේ සිට ක්‍රි.පූ. 2 වන සියවස දක්වා කාලය ඉන්දියානු ඉතිහාසයේ මෞර්ය යුගය වශයෙන් හඳුන්වනු ලබයි. මෞර්යයන් යනු ඉන්දියානු ඉතිහාසයේ නන්ද රාජ වංසයට පසුව නව රාජවංසයක් ගොඩනැගූ, උතුරු ඉන්දියානු මූලයක් ඇති පිරිසකි. චන්ද්‍රගුප්ත මෞර්ය, බිංදුසාර, අශෝක, මේ රාජවංසයේ කැපී පෙනෙන පාලකයන් වශයෙන් හඳුනාගත හැකිය. මෙම යුගය ඉන්දියානු ඉතිහාසය සම්බන්ධව පමණක් නොව, ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධයෙන් ද වැදගත් වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සභ්‍යත්වය ගොඩනැංවීමෙහිලා වැඩි දායකත්වයක් මෞර්යයන්ගෙන් ලැබුණි. එම නිසා මෞර්යයන්ගේ දේශපාලන ඉතිහාසය නිරවුල් කරගැනීම වැදගත් වේ. නමුත් බොහෝ ඉන්දියානු මූලාශ්‍රය මේ සම්බන්ධයෙන් ප්‍රාමාණික නොවන බව පෙනේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රස්තුත කාලපරිච්ඡේදය තුළ (ක්‍රි.පූ.4-2) ඉන්දියානු මූලාශ්‍රයවලින් නිරවුල්ව ගොඩනගා ගැනීමට අසීරු මෞර්යයන්ගේ දේශපාලන ඉතිහාසය ශ්‍රී ලාංකික මූලාශ්‍රය ඇසුරින් කෙතෙක් දුරට ගොඩනගා ගත හැකි ද යන්න විමසා බැලීමයි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය කිරීමයි.

**ප්‍රමුඛ පද - නන්ද රාජවංශය, මෞර්යයෝ, මෞර්ය චන්ද්‍රගුප්ත, බිංදුසාර, අශෝක**